ජාතික අයවැය දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික අයවැය 2026

## පුරවැසි අයවැය

**වාර්ෂික අයවැයෙහි ජනතා හිතවාදී අනුවාදයක්**

ජනවාරි 2026



# 2026 පුරවැසි අයවැය යනු කුමක්ද?



වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148-152 ව්‍යවස්ථාවන් ප්‍රකාරව) ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවයකි. 2026 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලට, 2026 වර්ෂය තුළ එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ආයතනයට අදාළ වැය සීමාවන් සමඟ මෙම වියදම් දැරීම සඳහා මූල්‍ය සම්පාදනය කිරීමේ යෝජිත මාධ්‍යයන් ඇතුළත් වන අතර එය ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ආකෘතිය සාමාන්‍ය ජනතාව හට සංකීර්ණ බවක් පෙන්නුම් කරයි.

එබැවින්, රාජ්‍ය අයවැයේ අන්තර්ගත තොරතුරු වඩාත් සරල හා අඩු පාරිභාෂික බවකින් යුතුව බෙදා හැරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව අදහස් කර ඇත. තවද, වාර්ෂික අයවැයේ ප්‍රධාන කරුණු විනිවිදභාවයකින් යුතුව හා පහසුවෙන් ග්‍රහණය කරගත හැකි පරිදි සාරාංශගත කර මහජන හිතකාමී අනුවාදයක් ලෙස ඉදිරිපත් කළ යුතු බවට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 20 වැනි වගන්තියේ සඳහන් වේ. මෙහිදී, සියලුම පුරවැසියන් සහ බදු ගෙවන්නන් හට, බදු ආදායම් වියදම් කරන ආකාරය සහ සම්පත් ප්‍රශස්ත ආකාරයකින් වෙන් කිරීමේදී රජයේ ප්‍රමුඛතා කවරේදැයි වඩා හොඳින් අවබෝධ කර ගත හැකි වනු ඇති අතර, මෙම ප්‍රවේශය තුළින් සම්පත් වෙන් කිරීම සහ එය කාර්යක්ෂමව උපයෝජනය කිරීම සම්බන්ධයෙන් විනිවිදභාවය සහ වගවීම සහතික කිරීමට මඟ පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වැය දරන ආයතනවල ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම වෙනුවට, මෙම ප්‍රකාශනය මඟින් අංශ අනුව ප්‍රධාන ව්‍යාපෘති / වැඩසටහන් සඳහා රජයේ වියදම් පිළිබඳ තොරතුරු සැකෙවින් සපයනු ලැබේ. තව ද, ණය සේවාකරණය සහ හදිසි සේවා සඳහා වන ප්‍රතිපාදන මෙම අංශ යටතේ නොසැලකේ. පරිශීලනය කිරීමේ පහසුව සඳහා ආංශික එකතුවෙහි රුපියල් අගයන් ආසන්නතම බිලියනයට වටයා ඇති බැවින්, ගිණුම්කරණ ආකෘතියේ සංඛ්‍යා සමඟ සැසඳීමේදී සුළු විෂමතා ඇතිවිය හැකිය.

එසේම, 2026 අයවැය යෝජනා ද ඇතුළත් කරමින් මෙම පුරවැසි අයවැය යාවත්කාලීන කරනු ඇත. මෙම ලේඛනය මෙරට දෘෂ්‍යාබාධිත පුද්ගලයින් හට ප්‍රවේශ විය හැකි පරිදි ඒකකේත (යුනිකෝඩ්) අකුරු වලින් ද ප්‍රකාශයට පත් කර ඇත.

# පටුන


1. ශ්‍රී ලංකාවේ අයවැය සකස් කිරීමේ ක්‍රියාවලිය
2. 2026 වර්ෂය සඳහා අයවැය සකස් කිරීමේ පදනම
3. ආදායම සහ වියදම
4. අයවැයෙහි සංක්ෂිප්තය






- සුවපත් සමාජයක් සඳහා නිරෝගි දිවි පෙවෙතක්
- අධ්‍යාපනයේ ගුණාත්මක බව, සමානාත්මතාවය හා විශිෂ්ටත්වය ළඟාකර ගැනීම
- ආරක්ෂිත, කාර්යක්ෂම,පරිසර හිතකාමී සහ තිරසාර ප්‍රවාහන සේවයක්
- යහපත්, සුවපහසු දිවියක් ගත කිරීමේ අපේක්ෂාවට සහාය වීම
- ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම සඳහා ඵලදායී, නවීකරණය කරන ලද තිරසාර කෘෂිකර්මයක්
- සදහරිත ජීවිතයක් සඳහා සහාය දීම
- සාමකාමී සහ සාධාරණ සමාජයක් සඳහා සහාය දීම
- ජාතික ආරක්ෂාව
- ආර්ථික සේවා සහ ව්‍යවසායකත්වය
- තිරසාර සහ ආරක්ෂිත බලශක්ති සැපයුම
- ජනතා හිතවාදී රාජ්‍ය සේවයක්
- සියල්ලන්ම ආවරණය වන සමාජ ආරක්ෂණ පද්ධතියක්

5. අයවැයෙහි පොදු විෂයන්

# වාර්ෂික අයවැය සකස් කිරීම

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව, ජාතික අයවැය සකස් කිරීමේ ක්‍රියාවලිය නිශ්චිත වාර්ෂික කාල රාමුවක් අනුගමනය කරමින් පිළියෙල කෙරේ. අයවැය කාල රාමුව මඟින් සෑම වසරකම ජාතික අයවැය සකස් කිරීම සහ අනුමත කිරීමට අදාළ ක්‍රියාකාරකම් සහ කාල නියමයන් දැක්වේ. අයවැය සකස් කිරීමේ ක්‍රියාවලිය අයවැය කැඳවීමේ චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ ආරම්භ වන අතර එමඟින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සහ දිශානතිය සපයනු ලැබේ. තව ද, අනුමත අයවැය මත පදනම්ව එළඹෙන වසර තුළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන වෙත වියදම් දැරීමට හැකි වනු පිණිස බලය පැවරීමේ චක්‍රලේඛය නිකුත් කිරීමෙන් අනතුරුව මෙම ක්‍රියාවලිය අවසන් වේ.

| | |
|---|---|
| 30 ජුනි \| 2025 | **අයවැය කැඳවීමේ චක්‍රලේඛය නිකුත් කිරීම** |
| 01 ජූලි \| 2025 | **2026 - විසර්ජන පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම** |
| 05 - 04 අගෝ සැප් 2025 | **අයවැය සාකච්ඡා පැවැත්වීම** |
| 08 සැප් \| 2025 | **විසර්ජන පනත් කෙටුම්පත සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම** |
| 18 සැප් \| 2025 | **විසර්ජන පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකිරීම** |
| 26 සැප් \| 2025 | **විසර්ජන පනත් කෙටුම්පත පළමු වර කියවීම** |
| 07 නොවැ \| 2025 | **විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීම (අයවැය කථාව)** |
| 08 - 15 නොවැ 2025 | **දෙවන වර කියවීමේ අයවැය විවාදය** |
| 13 නොවැ \| 2025 | **කාරක සභා අවස්ථාවේ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම** |
| 17 - 05 නොවැ දෙසැ 2025 | **තෙවන වර කියවීමේ අයවැය විවාදය** |
| 18 දෙසැ \| 2025 | **මුදල් ඇමතිතුමා විසින් අධිකාරී බලපත්‍ර අත්සන් කිරීම** |
| 30 දෙසැ \| 2025 | **වියදම් දැරීම සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛය භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කිරීම** |

# 2026 වර්ෂය සඳහා අයවැය සකස් කිරීමේ පදනම

රජය විසින් යම් මූල්‍ය වර්ෂයක් තුළ දැරීමට නියමිත වියදම් සඳහා බලය පැවරීම, එම වර්ෂය තුළ රජයේ ණය ගැනීම් සඳහා බලය පැවරීම සහ වර්ෂය තුළ රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා යම් විධිවිධාන සැලසීම පිණිස පාර්ලිමේන්තුව විසින් සෑම වසරකම විසර්ජන පනත් කෙටුම්පත සම්මත කරනු ලැබේ. 2026 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී පහත සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කරන ලදී.

1. පොහොසත් රටක් ලස්සන ජීවිතයක් - වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය

2. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ පහත දැක්වෙන දිශානතීන්

   - අදාළ මූල්‍ය වර්ෂය සඳහා ඇස්තමේන්තුගත නාමික දළ දේශීය නිෂ්පාදිතයෙන් 13% නොඉක්මවන පරිදි රජයේ ප්‍රාථමික වියදම පවත්වාගත යුතුය. (පනතේ 15 වැනි වගන්තිය)
   - වාර්ෂික අයවැය සංචිතය, ප්‍රාථමික වියදමේ යෝජිත ඇස්තමේන්තුවෙන් සියයට දෙකක් නොඉක්මවිය යුතුය. (පනතේ 25 වැනි වගන්තිය)

3. මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද 2025-2030 මධ්‍ය කාලීන සාර්ව-මූල්‍ය රාමුව

   - 2026 දී ආර්ථිකය සියයට 4-5 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ
   - 2026 දී රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් 15.4% ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ.
   - රජයේ වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් 20.5% ක මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.
   - 2026 දී රාජ්‍ය ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයෙන් 4.0% ක මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.
   - 2026 වසර සඳහා අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 5.1% ක මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.
   - දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.5% ක ප්‍රාථමික ශේෂයක් (ණය පොලී ගෙවීම් හැර වියදම) ළඟා කර ගැනීම (ණය අඩු කිරීම සහ මූල්‍ය ආරක්ෂණ නැවත ගොඩනැගීම සඳහා අවශ්‍ය පියවරක්)

# ආදායම
# සහ වියදම



## රාජ්‍ය ආදායම

2026 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුළු ආදායම රු. බිලියන 5,365 කි. එයින්, බදු ආදායම ලෙස රු. බිලියන 4,910ක් සහ ඉතිරි රු. බිලියන 465 ක මුදල බදු නොවන ආදායම සහ ප්‍රදාන ලෙසත් ලැබීමට අපේක්ෂා කෙරේ. බදු ආදායම ප්‍රධාන වශයෙන් වැට් බදු, බාහිර වෙළඳාම සඳහා බදු සහ සුරා බදුවලින් සමන්විත වන අතර බදු නොවන ආදායම දෙපාර්තමේන්තු ආදායම්, කුලී, ලාභාංශ සහ ගාස්තුවලින් සමන්විත වේ.



## රාජ්‍ය වියදම

ණය සේවාකරණය ඇතුළුව 2026 වර්ෂය සඳහා රජයේ වියදම රු. බිලියන 8,980 ක් වන අතර, එයින් රු. බිලියන 4,495ක් ණය සේවාකරණය සඳහා වෙන් කර ඇත. ණය පොලී සහ වට්ටම් ගෙවීම් සඳහා වන රු. බිලියන 2,617ක් සහ ණය ආපසු ගෙවීමට අදාළ රු. බිලියන 1,878ක් ද ඊට ඇතුළත් වේ. තව ද, ප්‍රාථමික වියදම රු. බිලියන 4,485ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. ප්‍රාථමික වියදම් යන්නට ණය ආපසු ගෙවීම සහ පොලී ගෙවීම් හැර අනෙකුත් සියලුම රජයේ වියදම් ඇතුළත් වේ.

ප්‍රාථමික වියදමෙහි වැටුප් හා වේතන (රු. බිලියන 1,464), විශ්‍රාම වැටුප් (රු. බිලියන 510), වෙනත් පුනරාවර්තන (රු. බිලියන 1,131) හා ප්‍රාග්ධන වියදම් (රු. බිලියන 1,380) අන්තර්ගත වේ.

## සවිස්තරාත්මක අයවැය ඇස්තමේන්තුවල සහ පුරවැසි අයවැයෙහි ව්‍යුහය

2026 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තු තුළ අමාත්‍යාංශ 25ක්, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ දෙපාර්තමේන්තු 134ක් සහ විශේෂ වියදම් ඒකක 21ක් යටතේ වියදම් අන්තර්ගත වේ. පුරවැසියන් හට මහජන හිතකාමී සංස්කරණයක් ඉදිරිපත් කිරීමේ අරමුණින් පුරවැසි අයවැය මඟින් සියලුම වියදම් අංශ 12කට සාරාංශගත කොට ඇත. තවද, එක් එක් වැය ශීර්ෂයෙන් උපුටා ගන්නා ලද ඩිජිටල්කරණය, නඩත්තු කටයුතු, පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සහ පර්යේෂණ හා සංවර්ධනය වැනි පොදු විෂයයන් මෙම ලේඛනයේ අවසාන කොටසේ වැඩිදුර තොරතුරු සඳහා ඉදිරිපත් කර ඇත.

# සුවපත් සමාජයක් සඳහා නිරෝගී දිවි පෙවෙතක්



# දිවයින පුරා පිහිටි රෝහල් ජාලය

ජාතික රෝහල් 03ක්, ශික්ෂණ රෝහල් 15ක්, විශේෂිත රෝහල් 14ක්, දිස්ත්‍රික් මහ රෝහල් 21ක් සහ මූලික රෝහල් සහ අනෙකුත් ප්‍රාදේශීය රෝහල්, සෞඛ්‍ය සේවා කාර්යාල සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා ඒකක හරහා සෞඛ්‍ය සේවා සැපයීම

සෞඛ්‍ය ආශ්‍රිත ආයතනවල වෛද්‍යවරුන් 25,447 ක්, හෙදියන් 41,075 ක්, පවුල් සෞඛ්‍ය සේවිකාවන් 9,169 ක්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 2,317 ක් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීම.

**2026 වර්ෂය සඳහා රු. බිලියන 657**

පුනරාවර්තන වියදම් රු. බිලියන **543.1**

ප්‍රාග්ධන වියදම් රු. බිලියන **113.6**

**රු. බිලියන** 43.4
රෝහල් සංවර්ධනය

**රු. බිලියන** 364.3
රෝහල් මෙහෙයුම්

**රු. බිලියන** 6.0
දේශීය වෛද්‍ය පහසුකම් සංවර්ධනය

**රු. බිලියන** 187.7
වෛද්‍ය සැපයුම්

**රු. බිලියන** 12.9
ත්‍රිපෝෂ ඇතුළු පෝෂණ වැඩසටහන්

**රු. බිලියන** 11.**9**
රෝග වැළැක්වීමේ ක්‍රමවේද

**රු. බිලියන** 1.3
සෞඛ්‍ය සම්බන්ධ පර්යේෂණ සහ සංවර්ධනය

**රු. බිලියන** 24.9
සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

**රු. බිලියන** 4.2
සුවසැරිය ගිලන්රථ සේවාව

# ඔබට ලැබෙන ප්‍රතිලාභ

| | | |
|---|---|---|
| 1. | ඖෂධ, ශල්‍යකර්ම සහ රසායනාගාර උපකරණවල අඛණ්ඩ සැපයුම සහතික කිරීම | රු. බිලියන **185.7** |
| 2. | රෝහල් වෙත ජෛව වෛද්‍ය උපකරණ සහ රසායනාගාර උපකරණ සැපයීම | රු. බිලියන **13.5** |
| 3. | රෝහල් සහ ජෛව වෛද්‍ය උපකරණ නඩත්තු කිරීම | රු. බිලියන **31.2** |
| 4. | මහනුවර රෝහලේ පිළිකා ප්‍රතිකාර, ඇටමිදුළු බද්ධ කිරීම සහ හදිසි ප්‍රතිකාර ඒකකයන්හි පහසුකම් වැඩිදියුණු කිරීම | රු. බිලියන **1.12** |
| 5. | හලාවත රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය සහ වාට්ටු වැඩිදියුණු කිරීම | රු. බිලියන **0.65** |
| 6. | රත්නපුර රෝහලේ හෘද සත්කාර, පිළිකා සහ ළමා ප්‍රතිකාර පහසුකම් වැඩිදියුණු කිරීම | රු. බිලියන **0.87** |
| 7. | ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර රෝහල්වල හදිසි ප්‍රතිකාර ඒකකයන්හි පහසුකම් වැඩිදියුණු කිරීම | රු. බිලියන **0.70** |
| 8. | බදුල්ල රෝහලේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. බිලියන **1.0** |
| 9. | මන්නාරම රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම | රු. බිලියන **0.23** |
| 10. | මොනරාගල රෝහලේ ශල්‍යාගාර පහසුකම් පුළුල් කිරීම | රු. බිලියන **0.5** |
| 11. | කෑගල්ල රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයේ පහසුකම් වැඩිදියුණු කිරීම | රු. බිලියන **0.5** |
| 12. | සාම්පල ප්‍රවාහනය සඳහා බයිසිකල්, සායනික අපද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ලොරි, රෝගීන් ප්‍රවාහනය සඳහා ගිලන්රථ, රෝහල්වල අපජල පවිත්‍රාගාර ප්‍රතිසංස්කරණය, වෛද්‍ය උපකරණ සැපයීම, තෝරාගත් ස්ථාන 300 ක ඇවිදීමේ මංතීරු සහ ව්‍යායාම ප්‍රදේශ ඉදිකිරීම සහ සෞඛ්‍ය ආශ්‍රිත කාර්යාල ප්‍රතිසංස්කරණය කිරීම තුළින් ප්‍රාථමික වෛද්‍ය සේවා සපයන ආයතන ශක්තිමත් කිරීම මඟින් දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවල ප්‍රාථමික සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශය සහ එහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම | රු. බිලියන **8.0** |
| 13. | මහනුවර, අනුරාධපුර, කුරුණෑගල, ත්‍රිකුණාමලය, බදුල්ල යන දිස්ත්‍රික්කවල තෝරාගත් රෝහල් ගොඩනැගිලි ඉදිකිරීම සහ අවශ්‍ය උපකරණ සැපයීම මඟින් වෛද්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම | රු. බිලියන **4.5** |
| 14. | ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා අධි ශක්ති විකිරණ සහිත උසස් තත්ත්වයේ විකිරණ චිකිත්සා පහසුකම් සලසා දීම | රු. බිලියන **2.5** |
| 15. | රෝහල් කාර්ය මණ්ඩලය ඇතුළුව සෞඛ්‍ය අංශයේ වැටුප් | රු. බිලියන **292.0** |
| 16. | රෝහල්වලින් බැහැර කරන සායනික අපද්‍රව්‍ය කළමනාකරණය | රු. බිලියන **1.3** |
| 17. | සෞඛ්‍යය තොරතුරුවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම | රු. බිලියන **3.0** |

## ප්‍රධාන සුබසාධන වැඩසටහන්



**රු. බිලියන 7.5**
ගර්භනී මව්වරුන් 265,000 කට පමණ පෝෂණීය ආහාර මල්ලක් ලබාදීම සඳහා



**රු. බිලියන 5.0**
ත්‍රිපෝෂ වැඩසටහන සඳහා



**රු. බිලියන 4.2**
සුවසැරිය ගිලන් රථ සේවාව සඳහා

**රු. බිලියන 0.3**
මාතෘ හා මුල් ළමාවිය පෝෂණ ව්‍යාපෘතිය සඳහා

**රු. බිලියන 1.2**
විශ්‍රාමිකයන්ගේ අග්‍රහාර රක්ෂණාවරණය සඳහා

# අධ්‍යාපනයේ ගුණාත්මක බව, සමානාත්මතාවය හා විශිෂ්ටත්වය ළඟාකර ගැනීම



- දිවයින පුරා **පාසල් 10,191** ක් හරහා **සිසුන් මිලියන 4.1** ක් පමණ සඳහා ගුණාත්මක පාසල් අධ්‍යාපනයක් ලබා දීම සහ **ගුරු කාර්ය මණ්ඩලය 236,129** ක් සේවයේ යෙදවීම

- **රජයේ විශ්වවිද්‍යාල 19** ක් මගින් **උපාධි අපේක්ෂකයින් 192,750** ක් පමණ සඳහා උසස් අධ්‍යාපනය ලබා දීම සහ අධ්‍යයන කාර්ය **මණ්ඩලය 11,521** ක් සහ **අනධ්‍යයන කාර්ය මණ්ඩලය 12,826** ක් සේවයේ යෙදවීම

- **සිසුන් 110,000**කට පමණ වෘත්තීය අධ්‍යාපනය ලබා දීම.



**රු. බිලියන 538.1 පාසල් අධ්‍යාපනය**

| | | |
|---|---|---|
| පාසල් අධ්‍යාපනයට අදාළ කාර්යමණ්ඩලය සඳහා පුද්ගල පඩිනඩි | - රු. බිලියන | **362.0** |
| පාසල් ගොඩනැගිලි සහ වෙනත් වත්කම් නඩත්තු කිරීම, පිළිසකර කිරීම සහ වැඩිදියුණු කිරීම | - රු. බිලියන | **23.7** |
| අ.පො.ස. සා.පෙළ, උ.පෙළ ඇතුළු පාසල් විභාග පැවැත්වීම | - රු. බිලියන | **9.1** |
| පිරිවෙන් අධ්‍යාපනය සඳහා සහාය දීම | - රු. බිලියන | **8.3** |
| ආපදාවන්ට මුහුණදීම සඳහා පාසල්වල ආරක්ෂක ක්‍රමෝපායන් වැඩි දියුණු කිරීම | - රු. බිලියන | **0.8** |
| පාසල්වල ක්‍රීඩා භූමි, ක්‍රීඩා යටිතල පහසුකම් සහ නේවාසිකාගාර සංවර්ධනය කිරීම | - රු. බිලියන | **0.98** |
| වතු ආශ්‍රිත පාසල් සඳහා පහසුකම් සැලසීම සහ සුහුරු පන්ති කාමර සැපයීම | - රු. බිලියන | **1.9** |

**රු. බිලියන 135.8 විශ්වවිද්‍යාල අධ්‍යාපනය**

| | | |
|---|---|---|
| සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීම | - රු. බිලියන | **6.4** |
| වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය | - රු. බිලියන | **1.2** |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණය ඉදි කිරීම | - රු. බිලියන | **2.0** |
| විශ්වවිද්‍යාලවල නේවාසිකාගාර, ආපනශාලා, දේශන ශාලා සහ රසායනාගාර ඇතුළු පහසුකම් ඉදිකිරීම | - රු. බිලියන | **5.6** |
| ජෙනරල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත රජයේ සහාය ලබා දීම | - රු. බිලියන | **7.5** |
| වැටුප් ගෙවීම් සහ විශ්වවිද්‍යාල ආශ්‍රිත වෙනත් වියදම් දැරීම | - රු. බිලියන | **88.5** |

**රු. බිලියන 21.0 වෘත්තීය අධ්‍යාපනය**

| | | |
|---|---|---|
| සියළුම පළාත්වල ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන විශිෂ්ටතා මධ්‍යස්ථාන බවට පරිවර්තනය කර එම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල වෘත්තීය මාර්ගෝපදේශක ඒකක ස්ථාපනය කිරීම | - රු. බිලියන | **2.0** |
| තාක්ෂණික, වෘත්තීය අධ්‍යාපන හා පුහුණුවට අදාළ වෘත්තීය වේදිකා ව්‍යාපෘතිය | - රු. බිලියන | **0.7** |
| ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ව්‍යවසායකයින් වෙත ණය පහසුකම් සැලසීමේ (ස්වයං රැකියා ප්‍රවර්ධන ප්‍රවේශය-I) වැඩසටහන | - රු. බිලියන | **0.3** |
| පුනර්ජනනීය බලශක්ති පුහුණු කේන්ද්‍රයක් ස්ථාපනය කිරීම | - රු. බිලියන | **0.26** |



# ප්‍රධාන සුබසාධන වැඩසටහන්

**පෙර පාසල්**



- පෙර පාසල් ගුරුවරුන් සඳහා ගුරු අභිමානී දීමනා- රු. බිලියන **1.2**
- පෙර පාසල් දරුවන් හට උදෑසන ආහාර ලබා දීම- රු. බිලියන **3.5**

**පාසල් ළමුන් සඳහා**



- පාසල්, වෘත්තීය අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර වෙනුවෙන් සහනාධාර ලබා දීම - රු. බිලියන **11.5**
- පාසල් පෝෂණ ආහාර වැඩසටහන - රු. බිලියන **33.6**
- පාසල් නිල ඇඳුම් - රු. බිලියන **6.4**
- දුෂ්කර හා අති දුෂ්කර පාසල් සහ පිරිවෙන්වල සිසුන් හට පාවහන් ලබා දීම - රු. බිලියන **2.5**
- ශිෂ්‍යාවන් වෙත සනීපාරක්ෂක තුවා ලබා දීම - රු. බිලියන **1.5**
- පෙළපොත් මුද්‍රණය - රු. බිලියන **15.0**
- ශිෂ්‍යාධාර (5 වසර ශිෂ්‍යත්වය) - **රු. බිලියන** 1.9
- ක්‍රීඩා පාසල් වෙත පෝෂ්‍යදායී ආහාර ලබා දීම - රු. බිලියන **0.15**
- පාසල් සිසුන් සඳහා සුරක්ෂා රක්ෂණාවරණය - රු. බිලියන **2.5**
- පාසැල් වයසේ දරුවන්ට ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම - රු. බිලියන **9.0**

**දහම් පාසල් සිසුන් සඳහා**

- දහම් පාසල් පෙළපොත් මුද්‍රණය - රු. බිලියන **0.20**

**විශ්වවිද්‍යාල සිසුන් සඳහා**



- විශ්වවිද්‍යාල සිසුන් සඳහා මහපොළ සහ ශිෂ්‍යාධාර - රු. බිලියන **7.0**
- රාජ්‍ය විශ්වවිද්‍යාල වෙත ප්‍රවේශය ලබා නොමැති සිසුන් සඳහා උසස් අධ්‍යාපනය හැදෑරීමට වන ණය යෝජනා ක්‍රමය - රු. බිලියන **3.0**
- රටවල් හා එක්ව සිදු කරනු ලබන ශිෂ්‍යත්ව අධ්‍යාපන වැඩසටහන් - රු. බිලියන **0.01**

**වෘත්තීය අධ්‍යාපනය**



- වෘත්තීය අධ්‍යාපනයේ නියැලී සිටින කථිකාචාර්යවරුන් සඳහා දිරිදීමනා සහ සිසුන් සඳහා දීමනා ලබා දීම - රු. බිලියන **0.24**
- නිපුණතා සිසු දිරිය ශිෂ්‍යත්වය - රු. බිලියන **1.25**
- වෘත්තීය පුහුණු අධ්‍යනායතනවල සිසුන් සඳහා වාර ප්‍රවේශ පත්‍ර - රු. බිලියන **0.21**

ආරක්ෂිත,
කාර්යක්ෂම,
පරිසර හිතකාමී සහ
තිරසාර ප්‍රවාහන සේවයක්



# එළඹෙන වසරේදී සිදු කිරීමට අපේක්ෂා කරනුයේ කුමක්ද?

- **ජාතික මාර්ග ජාලයේ කි.මී. 12,500**ක්, **පළාත් මාර්ග කි.මී. 12,800**ක් සහ දිවයින පුරා විහිදී ඇති **ග්‍රාමීය මාර්ග කි.මී. 100,000**ක් සහ ඒ ආශ්‍රිත අනෙකුත් මාර්ග යටිතල පහසුකම් නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම

- අධික රථවාහන තදබදයක් සහිත තෝරාගත් මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම

- අධිවේගී මාර්ග කි.මී.50ක් ඉදිකිරීම අඛණ්ඩව සිදු කිරීම.

- දිනපතා **දුම්රිය වාර 320**ක් පමණ ධාවනය කිරීම, දුම්රිය මාර්ග කි.මී. 1,550 ක් පමණ, දුම්රිය සංඥා පද්ධතිය සහ දුම්රිය ඇණිය නඩත්තු කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම.

- හිඟුරක්ගොඩ ගුවන් තොටුපල ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම

- ලංගම බස් ඇණිය නඩත්තු කිරීම සහ සවිමත් කිරීම

**2026 වර්ෂය සඳහා රු. බිලියන 477**

පුනරාවර්තන වියදම්
රු. බිලියන 54.8

ප්‍රාග්ධන වියදම්
රු. බිලියන 421.7

**රු. බිලියන 341**
මූලධන රු. බිලියන -332.1
පුනරාවර්තන රු. බිලියන - 8.5
මාර්ග
- එයින්, අධිවේගී මාර්ග සංවර්ධනය - රු. බිලියන - 104.4

**රු. බිලියන 17.9**
පාලම්

**රු. බිලියන 76.2**
මූලධන රු. බිලියන - 41.4
පුනරාවර්තන රු. බිලියන - 34.8
දුම්රිය

**රු. බිලියන 36.8**
මූලධන රු. බිලියන - 25.8
පුනරාවර්තන රු. බිලියන - 11.0
ප්‍රවාහන

**රු. බිලියන 5.0**
මූලධන රු. බිලියන - 4.5
පුනරාවර්තන රු. බිලියන - 0.5
වරාය සහ ගුවන් තොටුපල

# ඔබට ලැබෙන ප්‍රතිලාභ

**රු. බිලියන 341**
මූලධන රු. බිලියන - 332.1
පුනරාවර්තන රු. බිලියන - 8.5

## මාර්ග

| | |
|---|---|
| ජාතික හා පළාත් මාර්ග ජාලය නඩත්තු කිරීම, පුනරුත්ථාපනය කිරීම, පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම | - රු. බිලියන **50.4** |
| රථවාහන තදබදය අවම කිරීම සඳහා ප්‍රමුඛතා මාර්ග සහ ප්‍රධාන මාර්ගවල වටරවුම් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම | - රු. බිලියන **22.0** |
| මින් පෙර ක්‍රියාත්මක වූ මාර්ග සංවර්ධන වැඩසටහන්වල අර්ධ වශයෙන් වැඩ නිම කරන ලද මාර්ග ඇතුළුව දිවයින පුරා ග්‍රාමීය මාර්ග ජාලය වැඩිදියුණු කිරීම | - රු. බිලියන **62.0** |
| කඩවත - මීරිගම අධිවේගී මාර්ගය සහ පොතුහැර - රඹුක්කන අධිවේගී මාර්ගය ඉදිකිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම | - රු. බිලියන **98.0** |
| වරාය ප්‍රවේශ කුළුණු මතින් ඉදි වන අධිවේගී මාර්ගයේ වැඩ නිම කිරීම | - රු. බිලියන **12.5** |
| මාර්ග පුළුල් කිරීම සඳහා අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම | - රු. බිලියන **8.0** |
| රථවාහන තදබදය අවම කිරීම සඳහා කටුගස්තොට දුම්රිය මාර්ගයට පහළින් නව උමං මාර්ගයක් ඉදිකිරීම ඇතුළුව මහනුවර නගරයට ඇති පිවිසුම් මාර්ග වැඩිදියුණු කිරීම | - රු. බිලියන **2.6** |
| සමුද්‍රීය මාර්ගය, වරාය පිවිසුම් අධිවේගී මාර්ගය සමඟ සම්බන්ධ කිරීම, මන්නාරම සමඟ පුත්තලම සම්බන්ධ කිරීම සඳහා විකල්ප මාර්ගයක් හඳුනා ගැනීම, කයිට්ස් -කරෙනගර් පාලම, රත්නපුර අතුරු මාර්ගය, පද්දිරිප්පු පාලම, කින්නියඩි පාලම සහ කෝකිලායි පාලම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම | - රු. බිලියන **1.6** |
| අවදානම් සහගත මාර්ග කොටස්වල ආරක්ෂක ක්‍රමවේද අනුගමනය කිරීමෙන් මාර්ග ආරක්ෂාව ඉහළ නැංවීම | - රු. බිලියන **4.2** |

**රු. බිලියන 76.2**
මූලධන රු. බිලියන - 41.4
පුනරාවර්තන රු. බිලියන - 34.8

## දුම්රිය

| | |
|---|---|
| භාවිතයට පහසු විද්‍යුත් දුම්රිය ප්‍රවේශපත්‍ර මිලදී ගැනීමේ පද්ධතිය (ප්‍රවේශ) පුළුල් කිරීම | - රු. බිලියන **1.4** |
| කොළඹ දුම්රිය ස්ථානය ආරක්ෂිත, සුවපහසු සහ පිරිසිදු ස්ථානයක් බවට පරිවර්තනය කරමින් නවීකරණය කිරීම | - රු. බිලියන **0.8** |
| දෛනික දුම්රිය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස දුම්රිය එන්ජින්, මගී දුම්රිය, දුම්රිය මාර්ග සහ සංඥා පද්ධතිය නඩත්තු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම | - රු. බිලියන **14.0** |
| දෛනික දුම්රිය සේවා සැපයීම සඳහා දුම්රිය ඇණියට නව දුම්රිය පහක් එක් කිරීම | - රු. බිලියන **3.3** |
| උතුරු දුම්රිය මාර්ගයේ දුම්රිය සේවාවන්හි ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා මහව-ඕමන්තේ දුම්රිය මාර්ගයේ අර්ධ වශයෙන් නිම කරන ලද පාලම්, අලි මංකඩ සහ සංඥා පද්ධතියට අදාළ වැඩ නිම කිරීම | - රු. බිලියන **9.0** |
| දෛනික දුම්රිය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස දුම්රිය දෙපාර්තමේන්තුව වෙත අඛණ්ඩ ඉන්ධන සැපයුමක් ලබා දීම | - රු. බිලියන **14.0** |

# 2026 සඳහා යෝජිත ප්‍රධාන මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති




මෙම සිතියම මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය විසින් සකස් කරන ලදී

1 "ජපාන මිත්‍රත්ව මාර්ගය (0-2) (ආදර්ශ මාර්ග ව්‍යාපෘතිය)"

2 "කොළඹ - රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයේ තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම කි.මී. 38+000 - 58+890
+ අවිස්සාවේල්ල නගරයේ දී විකල්ප මාර්ගය (0+000-0+910)"

3 පහළ මාර්ගයේ අඹතලේ සිට කඩුවෙල දක්වා (8+500-13+000)

4 පිටකෝට්ටේ තලවතුගොඩ (0+000 -4+230)

5 කොට්ටේ - බෝපේ කි.මී. 3+800 - 6+990 (5+500)

6 මාලබේ - කඩුවෙල කි.මී. 0+000 - 5+630

7 "කොළඹ - ගාල්ල - හම්බන්තොට - වැල්ලවාය කි.මී. 8.34 - 9.64
සහා මාවත, දෙහිවල කි.මී. 0+00-0+140 "

8 පාගොඩ - පිටකෝට්ටේ කි.මී. 0+ 000- 1+540

9 "1) බම්බලපිටිය දුම්රිය ස්ථානය අසල දී මෙරයින් ඩ්‍රයිව් මාර්ගය හරහා මඟී පාලම නැවත ඉදිකිරීමට අදාළ ඉතිරි කටයුතු
2) වැල්ලවත්ත දුම්රිය ස්ථානය අසල දී මෙරයින් ඩ්‍රයිව් මාර්ගය හරහා මඟී පාලම නැවත ඉදිකිරීමට අදාළ ඉතිරි කටයුතු "

10 නාවල රාජගිරිය ඇල මාර්ගය හරහා නාවල පාලම ඉදිකිරීම

11 ඒකල - කොටදෙනියාව (3+000-9+000)

12 ඒකල - කොටදෙනියාව (21+000-27+000)

13 වැලිවේරිය කිරිඳිවැල මාර්ගය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (කි.මී. 6+000 - 12+860)

14 උඩුගම්පොල දිවුලපිටිය මාර්ගය වැඩිදියුණු කිරීම (0+000 - 13+000)

15 වත්තල හේකිත්ත පාර වැඩිදියුණු කිරීමේ කටයුතුවල ඉතිරි කාර්යයන් (0+000-1+500)

16 ජාඇල ඒකල පාර සහ පෑලියගොඩ පුත්තලම මාර්ගයේ ජාඇල අන්තර් හුවමාරුව වැඩිදියුණු කිරීමේ කටයුතුවල ඉතිරි කාර්යයන්

17 නිට්ටඹුව - පස්යාල මාර්ග ව්‍යාපෘතිය

18 කොළඹ හොරණ මාර්ගයේ තාර ඇතිරීම 24+950 - 28+180

19 "1) කොළඹ ගාල්ල හම්බන්තොට වැල්ලවාය මාර්ගයේ 39+420 - 41+700 දක්වා තාර ඇතිරීම
2) කොළඹ ගාල්ල හම්බන්තොට වැල්ලවාය මාර්ගයේ 45+460 - 50+970 දක්වා තාර ඇතිරීම
3) කොළඹ ගාල්ල හම්බන්තොට වැල්ලවාය මාර්ගයේ 51+250 - 52+370 දක්වා තාර ඇතිරීම
4) කොළඹ ගාල්ල හම්බන්තොට වැල්ලවාය මාර්ගයේ 59+970 - 60+970 දක්වා තාර ඇතිරීම "

20 හොරවල පැලවත්ත පිටිගල මාර්ගයේ අංක 4/1 දරන පාලම නැවත ඉදිකිරීමේ කටයුතුවල ඉතිරි කාර්යයන්

21 මහයියාව උමඟ සහ මාර්ග කොටස (1+960- 2+213)

22 විලියම් ගොපල්ලව මාවතේ මාර්ගය ඉදිකිරීම (2+900 -3+740)

23 විලියම් ගොපල්ලව මාවතේ මාදු ඇල ප්‍රදේශය ආශ්‍රිත ව්‍යුහයන් (1+600 -3+740)

24 ලුවිස් පීරිස් මාවත පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (0+000 - 0+860)

25 පේරාදෙණිය හල්ලොලුව කටුගස්තොට (3-10)

26 පේරාදෙණිය දෙල්තොට රිකිල්ලගස්කඩ 0-3

27 ඉහළ ගම්පොල මාර්ගය ( 0-2.28)

28 "1) පේරාදෙණිය දෙල්තොට රිකිල්ලගස්කඩ 28-42
2) පේරාදෙණිය දෙල්තොට රිකිල්ලගස්කඩ 22.75-26"

29 මහනුවර යාපනය මාර්ගයේ 4 වැනි තීරුව ඉදිකිරීම (70+650 -72+750)

30 මහනුවර යාපනය මාර්ගයේ අත්තිවාරම් දැමීමේ කටයුතු නිරවද්‍ය කිරීම් සහ තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම [කි.මී. 58+000 - 63+000]

31 "1) මාතලේ - ඉලුක්කුඹුර - ලග්ගල මාර්ගයේ තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම [කි.මී. 8+000 - 10+000]
2) මාතලේ - ඉලුක්කුඹුර - ලග්ගල මාර්ගයේ අත්තිවාරම් දැමීමේ කටයුතු නිරවද්‍ය කිරීම් සහ තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම [කි.මී. 18+000 - 26+000]"

32 "1) පලාපත්වෙල - ගලේවෙල මාර්ගයේ අත්තිවාරම් දැමීමේ කටයුතු නිරවද්‍ය කිරීම් සහ තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම [කි.මී. 23+000 - 27+000]
2) පලාපත්වෙල - ගලේවෙල මාර්ගයේ අත්තිවාරම් දැමීමේ කටයුතු නිරවද්‍ය කිරීම් සහ තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම [ කි.මී.19+000 - 23+000]"

33 වත්තේගම -කන්දේනුවර - වාරියපොල මාර්ගයේ අත්තිවාරම් දැමීමේ කටයුතු නිරවද්‍ය කිරීම් සහ තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම [කි.මී. 4+810 - 11+000]

34 පලාපත්වෙල ගලේවෙල [0+000 - 2+400]

35 පලාපත්වෙල ගලේවෙල [28+750 - 30+750]

36 නෝර්ටන් - මස්කෙලිය මාර්ගය (කි.මී. සීඑච් 7+000 - කි.මී. 13+000) තාර ඇතිරීම

37 කැරොලිනා නෝර්ටන් වනරාජ මාවත (කි.මී.සීඑච් 3+000 - කි.මී.8+530) තාර ඇතිරීම

38 හැටන් - මස්කෙලිය - ඩෙල්හවුස් පාර (සීඑච් කි.මී. 4+000 - කි.මී. 22+000) තාර ඇතිරීම

39 කන්දෙහන්දිය - අධිකාරිගම - රන්දෙණිගල - ලොග්ගල් ඔය පාර ( 7+000 - 11+000)

40 කොළඹ ගාල්ල හම්බන්තොට වැල්ලවාය පාර (154+000 - 167.0)

41 කොළඹ ගාල්ල හම්බන්තොට වැල්ලවාය පාර (173.0- 185.04 )

42 මාතර අකුරැස්ස පාර (4- 20.09)

43 ගාල්ල බද්දේගම පාර වැඩිදියුණු කිරීම (බී128) (2+000-2+306) - සරෙන්තුකඩේ හන්දිය

44 ගාල්ල බද්දේගම පාර වැඩිදියුණු කිරීම (බී128) (4+200-4+500) - කහදූවත්ත හන්දිය

45 කොළඹ ගාල්ල හම්බන්තොට වැල්ලවාය පාර සඳහා තාර ඇතිරීම (කි. මී. 273.88 - 281.9)

46 කොළඹ ගාල්ල හම්බන්තොට වැල්ලවාය පාර සඳහා තාර ඇතිරීම (කි. මී. 242.94 -252.88)

47 බෙලිඅත්ත කිරින්ද පාර අලුත්වැඩියා කිරීම (කි.මී.0+450 - 1+950 , 2+300-3+900 , 5+900 - 6+100 , 8+500 - 8+700)

48 දික්වැල්ල - බෙලිඅත්ත පාර වැඩිදියුණු කිරීම (කි.මී. 4+000 - 7+000)

49 දම්මුල්ල වීරකැටිය පාර වැඩිදියුණු කිරීම (කි.මී. 6+000 - 10+100)

50 යාපනය - පොන්නලායි පේදුරුතුඩුව මාර්ගයේ තාර කොන්ක්‍රීට් ඇතිරීම, මාර්ග සීමාව පුළුල් කර තාර ඇතිරීම සහ කානු ඉදිකිරීම (12+090-14+600),(0+650-1+720)

51 චාවකච්චේරි පුල්ලෝලි මාර්ගයේ තාර කොන්ක්‍රීට් ඇතිරීම, මාර්ග සීමාව පුළුල් කර තාර ඇතිරීම සහ බෝක්කු ඉදිකිරීම (3+600-7+500)

52 අචරන්කාල් - තොන්ඩයිමනාරු මාර්ගයේ තාර කොන්ක්‍රීට් ඇතිරීම, මාර්ග සීමාව පුළුල් කර තාර ඇතිරීම කි.මී. 0+000 - 6+000

53 තොන්ඩයිමනාරු - වලායි - තුන්නලායි මාර්ගයේ තාර කොන්ක්‍රීට් ඇතිරීම, මාර්ග සීමාව පුළුල් කර තාර ඇතිරීම සහ බෝක්කු තුනක් ඉදිකිරීම 0+000 - 4+000

54 උරුම්පිරායි කට්පකපිල්ලෙයියාර් කෝවිල් පාර සඳහා තාර තොන්ක්‍රීට් ඇතිරීම, මාර්ග සීමාව පුළුල් කිරීම සහ තාර දැමීම (0+000-1+600)

55 A009 මාර්ගයේ ඩිපෝ හන්දිය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (කි. මී. 252) - 2 වැනි අදියර

56 1) මුරුන්කන් - විලාවතුරෙයි මාර්ගය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (කි.මී. 0+000 - 6+000)

57 මාන්කුලම් - වෙල්ලන්කුලන්කුලම් මාර්ගය කි.මී. 31+900 - 39+900

58 වෙල්ලිකුලම් - මාමඩුව මාර්ගය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම ( 0+000-8+100)

59 ආවරණ ස්ලැබ් සමඟ කානු ඉදිකිරීම ඇතුළුව මහනුවර - යාපනය මාර්ගය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම කි.මී. 176+000 - 179 +000

60 පදිරුප්පු - වෙල්ලාවෙලි මාර්ගය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (1+430 - 2+850)

61 කොළඹ - රත්නපුර- වැල්ලවාය - මඩකලපුව පාර (සීඑච්: කි.මී. 300+000 - 308 +000)

62 කොළඹ - රත්නපුර- වැල්ලවාය - මඩකලපුව පාර (සීඑච්: කි.මී. 312+000 - 320 +000)

63 "1) අම්පාර - ඉඟිනියාගල මාර්ගය (සීඑච්: කි.මී.17 +000-21+710)"

64 "2) අම්පාර - ඉඟිනියාගල මාර්ගය (සීඑච්: කි.මී. 5+800 - 11+500 ) "

65 මඩකලපුව - තිරික්කොන්ඩියඩයිමඩු - ත්‍රිකුණාමලය (108.5+114)

66 කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම පාර (16+320-19+175) - (AA010)

67 නාරම්මල - දංකොටුව මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී. 40+120 - 42+120)

68 බුත්තල ඔය - උඩප්පුව - අනිමියුනි මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී. 0+000 - 2+000)

69 ගනේවල්පොල - දව්විහල්මිල්ලෑව මාර්ගය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (කි.මී. 27+000 - 31+000)

70 හුරිගස්වැව - කලන්කුට්ටිය - සියඹලාන්ගමුව - වැටකොලුවත්ත මාර්ගය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම ( කි.මී. 0+000 - 2+600)

71 මරදන්කඩවල හබරණ තිරික්කොන්දියමාඩු (25 - 31)

72 මරදන්කඩවල හබරණ තිරික්කොන්දියමාඩු (57 - 61)

73 බණ්ඩාරවෙල ලියන්ගහවෙල පූනගල (15-20)

74 හපුතලේ දඹේතැන්න (2-7)

75 දෙමෝදර ස්ප්‍රිංවැලි මාර්ගයේ තාර ඇතිරීම(12+920 -16+145)

76 පස්සර හිඟුරුක්ගොඩ පැලවත්ත මාර්ගයේ තාර ඇතිරීම (කි.මී. 9+000-15+000)

77 අවිස්සාවේල්ල - හැටන් - නුවරඑළිය මාර්ගය (0+065- 6+650)

78 නෙලුම්දෙණිය තුන්තොට 4/2 පාලම

79 වරකාපොල විකල්ප මාර්ගය

80 පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනාගම මාර්ගයේ තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම ( 15-30)

81 කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ (62+500 - 70+000) කොටස්වල සිට තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම

82 කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ (74+000- 86+000) කොටස්වල සිට තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම

83 කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ (87+500- 105+000) කොටස්වල සිට තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම

84 බලන්ගොඩ - රස්සාගල - ඌවෙල මාර්ගය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (5 - 9.38)

85 බලන්ගොඩ - බෝවත්ත - කල්තොට මාර්ගයේ තාර සහ කොන්ක්‍රීට් ඇතිරීම (16-23)

86 හුලන්දව පාලම නැවත ඉදිකිරීම 4/4 (2+300)

| | | |
|---|---|---|
| ග්‍රාමීය පාලම් වැඩි දියුණු කිරීම | - රු. බිලියන | 2.5 |
| කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම්වල ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම | - රු. බිලියන | 7.6 |
| ජාතික මාර්ගවල ඇති පාලම් ප්‍රතිසංස්කරණය කිරීම | - රු. බිලියන | 4.0 |

**රු. බිලියන 17.9**
**පාලම්**

| | | |
|---|---|---|
| දුර ගමන් සේවා සඳහා ශ්‍රීලංගම වෙත නව බස් රථ 600ක් එක් කිරීම | - රු. බිලියන | 3.6 |
| බස් රථ අළුත්වැඩියාව සඳහා ශ්‍රීලංගම වෙත එන්ජින් කට්ටල 307ක් ලබා දීම | - රු. බිලියන | 2.0 |
| පොදු ප්‍රවාහන පහසුකම් පුළුල් කිරීම පිණිස මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය සංවර්ධනය කිරීම | - රු. බිලියන | 10.7 |
| ශ්‍රීලංගම බස් රථ ඇණිය පුළුල් කිරීම සහ ආයතනික සංවර්ධනය | - රු. බිලියන | 2.0 |
| නව වාහන ලියාපදිංචිය සඳහා අංක තහඩු මිලදී ගැනීම | - රු. බිලියන | 1.0 |

**රු. බිලියන 36.8**
මූලධන රු. බිලියන - 25.8
පුනරාවර්තන රු. බිලියන - 11.0
**ප්‍රවාහන**

## ප්‍රධාන සුබසාධන වැඩසටහන්

**රු. බිලියන 3.3**

සමාජීය වශයෙන් අත්‍යාවශ්‍ය බස්සේවා (සිසු සැරිය, ගැමිසැරිය, නිසිසැරිය සහ රාත්‍රී බස් සේවාවන් ) සඳහා දයකත්වය.

**රු. බිලියන 4.0**

ආර්ථික වශයෙන් ලාභදායි නොවන මාර්ගවල කි.මී 270,000 ක පමණ දෛනිකව ලංගම බස්රථ. 1,500ක් යෙදවීම.



# ගෞරවාන්විත සුවපහසු දිවියක් ගත කිරීමේ අපේක්ෂාවට සහාය වීම



# එළඹෙන වසරේදී සිදු කිරීමට අපේක්ෂා කරනුයේ කුමක්ද?

- මධ්‍ය කාලීනව, නව නල ජල සැපයුම් සබඳතා මිලියනයක් පමණ ලබා දීම
- දැනට පවතින ජල සැපයුම් යෝජනා ක්‍රම 342 ක පමණ ආධාරයෙන් මිලියන 3.1 ක නිවාස, කර්මාන්ත සහ වෙනත් ආයතන සඳහා අඛණ්ඩ සුරක්ෂිත පානීය නල ජලය ලබා දීම
- දිවයින පුරා ප්‍රජා ජල සැපයුම් යෝජනා ක්‍රම 3,780 ක පමණ තිරසාරභාවය සහතික කිරීම
- 2026 වසරේ දී අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින් නිවාස ඒකක 20,000 ක පමණ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම
- මුළු දිවයිනම ආවරණය වන පරිදි ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**2026 වර්ෂය සඳහා රු. බිලියන 198**

පුනරාවර්තන වියදම් රු. බිලියන 11.4

ප්‍රාග්ධන වියදම් රු. බිලියන 186.5

**රු. බිලියන 85.7**
පුනරාවර්තන රු. බිලියන - 0.64
ප්‍රාග්ධන රු. බිලියන -85.1
පානීය ජල සැපයුම

**රු. බිලියන 50.9**
පුනරාවර්තන රු. බිලියන - 1.7
ප්‍රාග්ධන රු. බිලියන - 49.2
නිවාස

**රු. බිලියන 40.3**
ප්‍රාග්ධන රු. බිලියන - 40.3
ග්‍රාමීය සංවර්ධනය

**රු. බිලියන 14.3**
පුනරාවර්තන රු. බිලියන - 7.5
ප්‍රාග්ධන රු. බිලියන - 6.8
තරුණ සහ ක්‍රීඩා කටයුතු

**රු. බිලියන 6.5**
පුනරාවර්තන රු. බිලියන - 1.5
ප්‍රාග්ධන රු. බිලියන - 5.0
නාගරික ප්‍රදේශ තුල යටිතල පහසුකම් දියුණු කිරීම

# ප්‍රධාන වියදම් සංරචක



**රු. බිලියන 85.7**

පුනරාවර්තන රු. බිලියන - 0.64

ප්‍රාග්ධන රු. බිලියන - 85.1

## පානීය ජල සැපයුම

| | |
|---|---|
| පාතදුම්බර, පූජාපිටිය, අකුරණ, හාරිස්පත්තුව, ගඟවට කෝරළේ සහ තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙත නල ජලය සැපයීම (නුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය) | - රු. බිලියන **7.5** |
| යාපනය, කිලිනොච්චි සහ තදාසන්න ප්‍රදේශවලට නල ජල පහසුකම් සැපයීම | - රු. බිලියන **6.0** |
| පදවිය, කැබිතිගොල්ලෑව, කහටගස්දිගිලිය, හොරොව්පතාන සහ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙත නල ජලය සැපයීම (අනුරාධපුර උතුර ජල සම්පාදනම් ව්‍යාපෘතිය අදියර 11) | - රු. බිලියන **7.4** |
| බස්නාහිර පළාතේ දකුණු ප්‍රදේශයේ ජල සැපයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම, සුරක්ෂිත පානීය ජලය සැපයීම සහ දෙහිවල සහ මොරටුව ජල සම්පාදන ජාල වැඩිදියුණු කිරීම (කළු ගඟ ජල සැපයුම් පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 1) | - රු. බිලියන **1.1** |
| ගම්පහ, අත්තනගල්ල, මිනුවන්ගොඩ, තඹුත්තේගම, අලුත්ගම, මතුගම, අගලවත්ත, අලව්ව, පොල්ගහවෙල, පොතුහැර යන ප්‍රදේශවලට නල ජල සැපයුම් පහසුකම් සැලසීම | - රු. බිලියන **21.0** |
| ගිරිබාව ප්‍රදේශය වෙත නල ජල සැපයුම් පහසුකම් සැලසීම | - රු. බිලියන **1.0** |
| දිවයින පුරා නව ජල සබඳතා ලබා දීම සඳහා පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමවල ධාරිතාව පුළුල් කිරීම | - රු. බිලියන **11.2** |
| ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම 3,700 ක පමණ තිරසාරභාවය සහතික කිරීම | - රු. බිලියන **2.98** |
| රටෙහි පුරවැසියන් හට තිරසාර ජල සැපයුමක් සහතික කිරීම පිණිස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත රජයේ සහාය ලබා දීම | - රු. බිලියන **17.0** |



**රු. බිලියන 50.9**

පුනරාවර්තන රු. බිලියන - 1.7

ප්‍රාග්ධන රු. බිලියන - 49.2

## නිවාස

| | |
|---|---|
| කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ජනාවාස ප්‍රතිස්ථාපනගත කිරීම සඳහා ඉදිකිරීමට යෝජිත මුළු නිවාස ඒකක 50,000 න් තවත් නිවාස ඒකක 3,000 ක වැඩ නිම කිරීම (ස්ටේඩියම්ගම, ෆගියුසන්, මාදම්පිටිය, ඇපලවත්ත, කොළඹගේ මාවත, අරුණෝදය මාවත) | - රු. බිලියන **15.0** |
| දිළිඳු හා අඩු ආදායම්ලාභී නිවාස නොමැති පවුල් සඳහා නිවසක් තැනීමට සහාය වීම පිණිස "තමන්ගේ ම තැනක්- ලස්සන ජීවිතයක්" නිවාස ප්‍රදාන වැඩසටහන (නිවාස 7,000ක් ඉදිකිරීම) | - රු. බිලියන **10.2** |
| කොළඹ විවිධ තදාසන්න ප්‍රදේශවල ජීවත් වන අඩු ආදායම්ලාභී පුද්ගලයින් හට දැරිය හැකි පිරිවැයකට නිවාස ලබා දීම | - රු. බිලියන **6.5** |
| දිවයින පුරා වතු ජනතාව හට නව නිවාස ඒකක 2,500ක් පමණ ලබා දීම | - රු. බිලියන **5.65** |
| ගැටුම්වලින් පීඩාවට පත් පවුල් නැවත පදිංචි කිරීම සඳහා වන නිවාස ඒකක 2,445ක පමණ වැඩ අවසන් කිරීම | - රු. බිලියන **3.8** |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරන ලද පැරණි නිවාස යෝජනා ක්‍රමවල ගොඩනැගිලි, පොදු පහසුකම් සහ මලාපවහන පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම | - රු. බිලියන **0.68** |
| නායයෑම් තර්ජන සහ නායයෑම් හේතුවෙන් අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම (නිවාස 2,272 ක පමණ ඉතිරි වැඩ නිම කිරීම) | - රු. බිලියන **1.0** |

## රු. බිලියන 40.3 ග්‍රාමීය සංවර්ධනය

| | | |
|---|---|---|
| උතුරු, නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත්වල ග්‍රාමීය මාර්ග, කුඩා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධති සහ පානීය ජල සැපයුම් පහසුකම් වැනි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | - රු. බිලියන | **8.0** |
| ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සඳහා දයක වන අයුරින් පළාත්වල සමාජ-ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම (නිර්ණායක මත පදනම් වූ ප්‍රදාන) | - රු. බිලියන | **7.0** |
| කුඩා පරිමාණ ඉදිකිරීම්, අලුත්වැඩියා සහ මාර්ග සංවර්ධන කටයුතු, විවිධ භාණ්ඩ හා උපකරණ බෙදා හැරීම සහ දිවයින පුරා ආදායම් උත්පාදන ව්‍යාපෘති (**DCB**), සහ දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන | - රු. බිලියන | **4.5** |

## රු. බිලියන 6.5

පුනරාවර්තන රු. බිලියන - 1.5
ප්‍රාග්ධන රු. බිලියන - 5.0

## නාගරික ප්‍රදේශ තුළ යටිතල පහසුකම් දියුණු කිරීම

| | | |
|---|---|---|
| නගර 100ක නාගරික යටිතල පහසුකම් සහ නගර කලාප සංවර්ධනය (සියක් නගර) | - රු. බිලියන | **0.93** |
| යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය | - රු. බිලියන | **0.22** |
| ක්‍රමෝපායික නගර සංවර්ධනය- අනුරාධපුර | - රු. බිලියන | **0.70** |
| ක්‍රමෝපායික නගර සංවර්ධනය- යාපනය | - රු. බිලියන | **0.02** |
| තිරසර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය | - රු. බිලියන | **1.47** |
| උතුරු සහ නැගෙනහිර පළාත්වල ඒකාබද්ධ ප්‍රාදේශීය සංවර්ධනය | - රු. බිලියන | **0.3** |

## රු. බිලියන 14.3

පුනරාවර්තන රු. බිලියන - 7.5
ප්‍රාග්ධන රු. බිලියන - 6.8

## තරුණ සහ ක්‍රීඩා කටයුතු

| | | |
|---|---|---|
| පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම | - රු. බිලියන | **0.15** |
| දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම | - රු. බිලියන | **0.22** |
| කල්මුනෙයි ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම | - රු. බිලියන | **0.15** |
| ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම | - රු. බිලියන | **2.6** |

## ප්‍රධාන සුබසාධන වැඩසටහන්

**රු. බිලියන 0.35**

ජාතික ක්‍රීඩා සංසද සඳහා ක්‍රියාත්මක වන අඛණ්ඩ පෝෂණ වැඩසටහ

## ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම සඳහා ඵලදායී, නවීකරණය කරන ලද තිරසාර කෘෂිකර්මයක්



## 2026 වර්ෂය සඳහා රු. බිලියන 284

**පුනරාවර්තන වියදම්**
රු. බිලියන 110.1

**ප්‍රාග්ධන වියදම්**
රු. බිලියන 173.5

**රු. බිලියන 138.9**
පුනරාවර්තන රු. බිලියන - 70.7
ප්‍රාග්ධන රු. බිලියන - 68.1
කෘෂිකර්මය

**රු. බිලියන 91.7**
පුනරාවර්තන රු. බිලියන - 12.3
ප්‍රාග්ධන රු. බිලියන - 79.4
වාරිමාර්ග

**රු. බිලියන 9.2**
පුනරාවර්තන රු. බිලියන - 1.0
ප්‍රාග්ධන රු. බිලියන - 8.2
පශු සම්පත්

**රු. බිලියන 19.1**
පුනරාවර්තන රු. බිලියන - 13.5
ප්‍රාග්ධන රු. බිලියන - 5.6
වැවිලි කර්මාන්ත

**රු. බිලියන 11.8**
පුනරාවර්තන රු. බිලියන - 4.1
ප්‍රාග්ධන රු. බිලියන -7.7
ධීවර

**රු. බිලියන 13.0**
පුනරාවර්තන රු. බිලියන - 8.5
ප්‍රාග්ධන රු. බිලියන - 4.5
ඉඩම්

# ප්‍රධාන වියදම් අයිතම

**රු. බිලියන 138.9**
පුනරාවර්තන රු. බිලියන - 70.7
ප්‍රාග්ධන රු. බිලියන - 68.1
කෘෂිකර්මය

| | | |
|---|---|---|
| දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම පිළිවෙත් අනුගමනය කිරීම සහ වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීම, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම, කිලිනොච්චිය, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පොදු ගබඩා කිරීම්, සැකසීමේ ක්‍රියාවලිය සහ අලෙවිකරණය සම්බන්ධයෙන් තීරණාත්මක වන වෙළඳපල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම/ප්‍රතිසංස්කරණය කිරීම තුළින් කෘෂිකාර්මික ඵලදායිතාව සහ විවිධාංගීකරණය ඉහළ නැංවීම | - රු. බිලියන | **4.0** |
| වාණිජ හවුල්කාරිත්වයන් ගොඩනැගීම, මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය සැලසීම, තාක්ෂණික දැනුම සහ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම, කෘෂිකර්මාන්තය වෙත යාන්ත්‍රිකකරණය හඳුන්වා දීම සඳහා දිවයින පුරා ග්‍රාමීය ගොවි ජනතාවට පහසුකම් සැලසීම | - රු. බිලියන | **1.67** |
| පුත්තලම, කුරුණෑගල, මාතලේ, අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම ග්‍රාමීය ගොවි ජනතාවට සහාය වීම, ඔවුන් දේශගුණික විපර්යාසයන්ගෙන් වන බලපෑමට ඔරොත්තු දිය හැකි ලෙස ශක්තිමත් කිරීම සහ සමෘද්ධිමත් කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම | - රු. බිලියන | **9.3** |
| යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්, වවුනියාව, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, මාතලේ, නුවරඑළිය, මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල කෘෂි ආහාර නිෂ්පාදකයින්ගේ ඵලදායිතාව, වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමේ හැකියාව සහ දේශගුණික විපර්යාසයන්ගෙන් වන බලපෑමට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම | - රු. බිලියන | **1.5** |
| උසස් තත්ත්වයේ බීජ මිලදී ගැනීම සහ ඒවා ගොවීන් වෙත බෙදා හැරීම | - රු. බිලියන | **1.2** |
| පළාත්සභා යටතේ වන කෘෂිකර්මාන්තය සහ වාරිමාර්ග ආශ්‍රිත යටිතල පහසුකම් නඩත්තු කිරීම, පුනරුත්ථාපනය කිරීම | - රු. බිලියන | **13.63** |
| ආරක්ෂක වී තොග පවත්වාගැනීම- | - රු. බිලියන | **10.0** |

| | |
|---|---|
| කෝන්ගැටිය සිට මඩත්තාව දක්වා උතුරු මැද පළාත් ඇළ මාර්ගයේ කිලෝමීටර 27.7 ක් පමණ ඉදිකිරීම, මොරගහකන්ද සිට කෝන්ගැටිය දක්වා ඇළ මාර්ගයේ සහ මඩත්තාව සිට කෝඳුරුවැව දක්වා ඇළ මාර්ගයේ ඉතිරි වී ඇති වැඩ අවසන් කිරීම (මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන ii වැඩසටහන) | - රු. බිලියන **29.0** |
| දිවයින පුරා වැව් සහ වේලි ආශ්‍රිත වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම, ජල පෝෂක කළමනාකරණය, ජල පෝෂක ප්‍රතිසංස්කරණය (ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය) | - රු. බිලියන **5.1** |
| මාතලේ, මහනුවර, කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ග්‍රාමීය වැව්, පොකුණු, වාරිමාර්ග ජාල ප්‍රතිසංස්කරණය කිරීම සහ වනාන්තර හා ඉවුරුබද ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම | - රු. බිලියන **3.2** |
| මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය | - රු. බිලියන **1.0** |
| දිවයින පුරා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලුම වාරිමාර්ග යෝජනා ක්‍රමවල මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සිදු කිරීම | - රු. බිලියන **2.2** |
| දිවයින පුරා තෝරාගත් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමවල අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | - රු. බිලියන **6.5** |
| මල්වතු ඔය හරහා ජලාශයක් ඉදිකිරීම සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය | - රු. බිලියන **5.0** |
| සුළු වාරිමාර්ග, ග්‍රාමීය වැව් එල්ලංගා පද්ධති සහ අතහැර දමන ලද කුඹුරු ඉඩම් සංවර්ධනය | - රු. බිලියන **3.0** |
| දිවයින පුරා ප්‍රධාන වේලි සහ ජලාශ වල මෙහෙයුම් කටයුතු, පිළිසකර කිරීම්, නඩත්තු කටයුතු, කෘෂිකාර්මික හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය, මහවැලි අධිකාරිය යටතේ කෘෂිකාර්මික නවෝත්පාදනය සහ ජීවනෝපාය ප්‍රවර්ධනය | - රු. බිලියන **3.6** |
| කිවුල් ඔය ජලාශය ඉදිකිරීම | - රු. බිලියන **2.5** |
| ඇල්ලේ වැව ජලාශය | - රු. බිලියන **1.0** |



**රු. බිලියන 91.7**

පුනරාවර්තන රු. බිලියන - 12.3

ප්‍රාග්ධන රු. බිලියන - 79.4

## වාරිමාර්ග



**රු. බිලියන 9.2**

පුනරාවර්තන රු. බිලියන - 1.0

ප්‍රාග්ධන රු. බිලියන - 8.2

## පශු සම්පත්

| | |
|---|---|
| එළුවන් ඇති කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ දිවයින පුරා හඳුනාගත් කුඩා හා මධ්‍ය පරිමාණ එළු ගොවිපලවල් සඳහා ගොවිපල යෙදවුම් සහන මිලට සැපයීම | - රු. බිලියන **0.20** |
| සත්ව පාලනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සත්ව නිෂ්පාදන (බිත්තර සහ කුකුල් මස්) සහ විසිතුරු මත්ස්‍යයන් අපනයනය කිරීම ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැලසීම සහ හඳුනාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් වෙත ගොවිපල යෙදවුම් සහන මිලට සැපයීම | - රු. බිලියන **1.5** |
| ඉහළ ජානමය විභවයක් ඇති ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු සතුන් සංඛ්‍යාව වැඩි කිරීම | - රු. බිලියන **1.1** |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද කෘෂිකර්ම සහ පශු සම්පත් වැඩසටහන | - රු. බිලියන **1.4** |
| කිරි නිෂ්පාදන අංශයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම | - රු. බිලියන **0.38** |

| | |
|---|---|
| ගන්දර ධීවර වරාය ඉදි කිරීම | - රු. බිලියන **1.36** |
| මයිලඩි ධීවර වරාය සංවර්ධනය | - රු. බිලියන **0.22** |
| ධීවර කර්මාන්තය සඳහා ආධාරක උපකරණ සැපයීම | - රු. බිලියන **0.9** |
| පසු අස්වනු අලාභය අවම කිරීම තුළින් ජීවනෝපාය ඉහළ නැංවීම පිණිස කුඩා පරිමාණ ගොඩබෑමේ ස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීම | - රු. බිලියන **0.5** |
| වරායන් 15 ක දැනට පවතින ධීවර යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය, පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම | - රු. බිලියන **0.3** |
| වාලච්චේන වරාය ප්‍රතිසංස්කරණය | - රු. බිලියන **0.35** |
| සී-නෝර් පදනම මඟින් ක්‍රියාත්මක වන කරෙයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම | - රු. බිලියන **0.35** |



**රු. බිලියන 11.8**

පුනරාවර්තන රු. බිලියන - 4.1

ප්‍රාග්ධන රු. බිලියන - 7.7

## ධීවර

කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදනය, අලෙවිකරණ ක්‍රියාකාරකම්, ඵලදායිතාව වර්ධනය කිරීම සහ කුඩා තේ වතු හිමියන්ගේ සුභසාධනය සඳහා කටයුතු කිරීම අරමුණු කරගත් සංවර්ධන කටයුතු - රු. බිලියන **1.0**

පොල් නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ උතුරු පොල් ත්‍රිකෝණ වැඩසටහන - රු. බිලියන **0.6**

**රු. බිලියන 19.1**
පුනරාවර්තන රු. බිලියන - 13.5
ප්‍රාග්ධන රු. බිලියන - 5.6

## වැවිලි කර්මාන්ත

**රු. බිලියන 13.0**
පුනරාවර්තන රු. බිලියන - 8.5
ප්‍රාග්ධන රු. බිලියන - 4.5

## ඉඩම්

රාජ්‍ය කටයුතු සඳහා ඉඩම් අත්පත් කරගැනීම - රු. බිලියන **2.66**

බිම් සවිය වැඩසටහන - රු. බිලියන **0.73**

# ප්‍රධාන සුබසාධන වැඩසටහන්

රු. බිලියන 36.9



රසායනික හා කාබනික පොහොර සඳහා පොහොර සහනාධාර වැඩසටහන



රු. බිලියන 5.55

ගොවි විශ්‍රාම වැටුප්

* රු. බිලියන 3.0

" රාජ්‍ය අනුග්‍රහය යටතේ ගොවීන් හට බෝග 6 ක් (වී, බඩ ඉරිඟු, ලොකු ළූණු, මිරිස්, අර්තාපල් සහ සෝයා බෝංචි) සඳහා නොමිලේ ක්‍රියාත්මක කර වගා රක්ෂණ යෝජනා ක්‍රමය

රු. බිලියන 1.1




අපනයන බෝග සංවර්ධනය වෙනුවෙන් ගොවීන්ට සහාය වීම



රු. බිලියන 0.25

" කුරුඳු කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා ගොවීන් හට සහාය ලබා දීම

රු. බිලියන 0.5



රබර් සඳහා සහනාධාර



රු. බිලියන 0.29

අතහැර දමා ඇති මේරූ රබර් වගාවන් නැවත වගා කිරීම

*** එයින් රුපියල් බිලියන 1.2 ක් නිල්වලා ගඟේ ගංවතුර හේතුවෙන් වී වගාවට සිදු වූ හානි සඳහා ගොවීන්ට වන්දි ගෙවීම සඳහා වෙන් කර ඇත.**

# සදාහරිත ජීවිතයක් සඳහා සහාය දීම



**2026 වර්ෂය සඳහා රු. බිලියන 58**

පුනරාවර්තන වියදම් රු. බිලියන 14.7

ප්‍රාග්ධන වියදම් රු. බිලියන 43.3

රු. බිලියන 2.0 වෙරළ ආරක්ෂණය

රු. බිලියන 17.24 ආපදා කළමනාකරණය

රු. බිලියන 8.55 පරිසර සංරක්ෂණය

රු. බිලියන 4.0 වැසි ජල කළමනාකරණය

රු. බිලියන 5.0 අපද්‍රව්‍ය කළමනාකරණය

රු. බිලියන 7.4 වන ජීවී සංරක්ෂණය

රු. බිලියන 13.7 අපජලය කළමනාකරණය

## ප්‍රධාන වියදම් සංරචක

**රු. බිලියන 17.2 ආපදා කළමනාකරණය**

| | | |
|---|---|---|
| ආපදා බලපෑම අවම කරගැනීම සඳහා ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | - රු. බිලියන | **0.50** |
| ගංවතුර සහ නායයෑම් ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණයේ ධාරිතාව වර්ධනය කිරීම | - රු. බිලියන | **0.01** |
| ගංවතුර සහ නායයෑම් වලින් බලපෑමට පත් ප්‍රදේශවල පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු | - රු. බිලියන | **0.60** |
| නායයෑම් පිළිබඳ විමර්ශන, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු | - රු. බිලියන | **0.10** |
| ගම්මාන, පොදු ස්ථාන, ප්‍රධාන මාර්ග සහ උඩරට දුම්රිය මාර්ගයට අදාලව තෝරාගත් නායයෑම් ස්ථාන 128 ක පමණ කඩිනම් ප්‍රතිසංස්කරණ කිරීම් | - රු. බිලියන | **7.28** |
| පූර්ව අනතුරු ඇඟවීමේ තාක්ෂණය | - රු. බිලියන | **0.01** |
| ශ්‍රී ලංකාවේ ජාතික ගොඩනැගිලි කාර්යසංග්‍රහය සකස් කිරීම සහ ස්ථාපනය කිරීම | - රු. බිලියන | **0.07** |
| ඩොප්ලර් කාලගුණ රේඩාර් පද්ධතිය | - රු. බිලියන | **3.75** |
| නාය යාම් අවදානම් සහ නාය යාම් හේතුවෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම | - රු. බිලියන | **3.0** |

**රු. බිලියන 7.4 වන ජීවී සංරක්ෂණය**

| | | |
|---|---|---|
| අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා දැනට පවතින විදුලි වැටවල් කිලෝමීටර් 5,600 ක් පමණ නඩත්තු කිරීම | - රු. බිලියන | **0.62** |
| කිලෝමීටර 520 ක පමණ විදුලි වැටවල් ඉදිකිරීම | - රු. බිලියන | 1.0 |
| වනජීවීන් සම්බන්ධ කාර්යයන් සඳහා වාසභූමි වැඩිදියුණු කිරීම | - රු. බිලියන | **0.08** |

**රු. බිලියන 8.55**
**පරිසර සංරක්ෂණය**

| | |
|---|---|
| කෘෂිකර්මය, වන සම්පත් සහ අනෙකුත් භූමි පරිහරණ ක්ෂේත්‍ර සඳහා පුළුල් පාරදෘශ්‍ය රාමුවක් වැඩි දියුණු කිරීම | - රු. බිලියන **0.10** |
| දේශගුණ විපර්යාසයේ වර්ධිත බලපෑම්වලට මුහුණ දීම සඳහා අවදානම්පාත්‍රී ප්‍රජාවන් ශක්තිමත් කිරීම | - රු. බිලියන **0.11** |
| කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ භාවිත වන වියෝජනය නොවන කාබනික දූෂක (බිඳවැටීමට ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු, පරිසරය හරහා දිගු දුරක් ගමන් කළ හැකි විෂ සහිත රසායනික ද්‍රව්‍ය) සහිත පලිබෝධනාශක සහ සෞඛ්‍ය අංශයේ භාවිත වන රසදිය සහ අපද්‍රව්‍ය සමෝධානිකව කළමනාකරණය කිරීම සහ පරිසර හිතකාමී අයුරින් බැහැර කිරීම | - රු. බිලියන **0.11** |
| වන ආවරණය පුළුල් කිරීම | - රු. බිලියන **1.0** |
| ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය | - රු. බිලියන **0.06** |
| කලපු සහ වෙරළබඩ තීරය සංරක්ෂණය කිරීම | - රු. බිලියන **0.5** |

**රු. බිලියන 13.7**
**අපජලය කළමනාකරණය**

| | |
|---|---|
| මහනුවර නගරය සහ තදාසන්න ප්‍රදේශවල අපජලය රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බැහැර කිරීම සඳහා පහසුකම් සැලසීම | - රු. බිලියන **2.11** |
| ඇල්ල නගරය සඳහා අපජල කළමනාකරණ පද්ධතිය | - රු. බිලියන **0.30** |
